**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2025**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේදී දිස්ත්‍රික්ක 03ක් වෙත සහනාධාර නව නිකුත් කිරීම් ලෙස ලබාදී තිබූ රු.1,264,282ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබූ අතර, එම මුදල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ නොපියවූ අත්තිකාරම් ලෙස අඛණ්ඩව දක්වා තිබුණි. | රු.1,000,000 ක මුදල හා රජයේ ආදායමට බැර කල ලෙස සඳහන් රු.264,282 ක මුදල මෙලෙස නොපියවූ අත්තිකාරම් ලෙස 2025 වර්ෂයේ ගිණුම් ගත කර ඇත. මෙම මුදලින් රු.මි.1 ක මුදල මන්නාරම් දිස්ත්‍රික්කයෙන් අත්තිකාරම් පියවීම සඳහා ලබාදුන් මුදලක් වන අතර එම මුදල ද 2019 නව සමෘද්ධි සහනාධාර හිමිකම්පත් බෙදා දීමේ කටයුතු වෙනුවෙන්ම වැය කර ඇති බවට තහවුරු වූ බැවින් 2026 මැයි 12 දිනැති භාරකාර මණ්ඩලය විසින් එම මුදල 2019 නව සමෘද්ධි සහනාධාර හිමිකම්පත් බෙදා දීමේ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුදලක් ලෙස සලකා ගිණුම්ගත කිරීමට අනුමැතිය ලබාදී ඇත. | අත්තිකාරම් වර්ෂය තුලදී පියවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමටත් මෙසේ දීර්ඝ කාලීනව ජංගම වත්කම් යටතේ පෙන්වීම නිවැරදි කිරීමට සහ ඉදිරියේදී මෙවැනි තත්ත්වයක් නොවීමටත් වගබලා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 240,377,744 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 748,179,534 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 507,801,790 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී ආයෝජන පොළී ආදායම අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2016 ජුලි 11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 16/1316/711/023/-1 මඟින් අනුමැතිය ලබාගෙන, සේවා ලංකා පදනමට අයත් ගෝපාලපුරම්, නිලාවේලි ප්‍රදේශයේ පිහිටි අක්කර 7 පර්චස් 37ක ඉඩම හා එහි පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය රු.මිලියන 126ක වටිනාකමකට අරමුදල විසින් අත්පත් කරගෙන තිබුණි. දිවිනැගුම ප්‍රතිලාභීන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ආබාධිත පුද්ගලයන් හා තනිමාපිය පවුල් සඳහා ආදායම් හා ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කරගනිමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණද, සමාලෝචිත වර්ෂයේදී පුහුණු වැඩසටහන් 05ක් පමණක් පවත්වා තිබුණි. තවද, පසුගිය වර්ෂ 03ක ආදායම් හා වියදම් සලකා බැලීමේදී මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා අරමුදලේ මුදල්වලින් සැලකිය යුතු වියදම් දැරීමට සිදුව තිබීම හේතුවෙන්, එම මධ්‍යස්ථානය අත්පත් කර ගැනීමේ අරමුණු හා අරමුදලේ අරමුණු අපේක්ෂිත පරිදි ඵලදායීව ඉටු වී නොතිබුණි. | මේ වන විට ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය හා රාජ්‍ය නොවන මෙන්ම පෞද්ගලික ආයතන වලට පුහුණු සැසි හා වැඩමුළු පැවැත්වීම සඳහා සහනදායී මිළ ගණන් යටතේ අවශ්‍ය පහසුකම් සපයා දීම සිදු කරනු ලබයි. එමෙන්ම මෙම පුහුණු මධ්‍යස්ථානය මිළ දී ගන්නා අවස්ථාවේ දී ද කාමර පහසුකම් පැවති අතර, ඒවා නවීකරණය කර නේවාසික පහසුකම් සලසා පුහුණු මධ්‍යස්ථානයේ අදායම ඉහළ නංවාගැනීමට කටයුතු සිදු කර ඇති අතර මෙම ප්‍රදේශය ප්‍රසිද්ධ සංචාරක ආකාර්ශනයක් ඇති ප්‍රදේශයක් බැවින් නවාතැන් පහසුකම් සඳහා ඉල්ලුමක් ද පවතී. | මධ්‍යස්ථානයේ පවතින භෞතික හා මානව සම්පත් උපරිම ඵලදායීතාවයෙන් උපයෝජනය කරමින් අරමුදලේ අරමුණු ඉටු කිරීමට ප්‍රමාණවත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත්, මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් අතර තිරසාර මූල්‍ය සමතුලිතතාවක් ඇති වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරීන්ගෙන් ලබාගත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට අදාළව රු.7,683,746 ක ආදායමක් ගිණුම්ගත කර තිබුණද, මධ්‍යස්ථානය වෙත ලැබිය යුතු සියලු ආදායම් සම්පූර්ණයෙන් හඳුනාගෙන නිසි පරිදි වාර්තා කිරීම හා ගිණුම්ගත කිරීම තහවුරු වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන හා අධීක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කර නොතිබුණි. | නිලාවේලි පුහුණු මධ්‍යස්ථානය වෙත ලැබෙන සියළුම මුදල් සඳහා පොදු 172 කුවිතාන්සි නිකුත් කරන ලෙස හා ගිණුම් සටහන් තැබීම පිළිබඳව උපදෙස් ලබා දී ඇති අතර, තවදුරටත් විධිමත් කර ගැනීම සඳහා ලිඛිත උපදෙස් ලබා දී ඇත. | මධ්‍යස්ථානය වෙත ලැබෙන සියලු ආදායම් විධිමත් ලෙස වාර්තා කර ගිණුම්ගත කිරීම තහවුරු වන පරිදි ඵලදායී අභ්‍යන්තර පාලන හා අධීක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 මැයි 22 දිනැති නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ කාමර 05ක් නවීකරණය කිරීමේ ගිවිසුම යටතේ රඳවාගත් රු.488,058ක මුදල ආපසු ගෙවීමේදී, මුදල් රෙගුලාසි 237 උපලේඛනය 1 ඒ (III) ප්‍රකාරව අවසන් සහතිකය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබියදී ගෙවීම සිදුකර තිබුණි. තවද, 2023 වර්ෂයෙන් පසු මධ්‍යස්ථානයේ නවීකරණ හා නඩත්තු කටයුතු ප්‍රමාණවත් ලෙස සිදුකර නොතිබීම හේතුවෙන් ගොඩනැගිලි අබලන් තත්ත්වයක පැවතුණි. | නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ කාමර 05 නවීකරණයට අදාලව තාක්ෂණ නිලධාරි විසින් ලබාදුන් නිර්දේශයට අනුව ගොනු සටහන් මඟින් අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ අනුමැතිය මත රඳවුම් මුදල් නිදහස් කිරීම සිදු කර ඇත. මු.රෙ. 237 උපලේඛණ 1 ඒ (III) යටතේ අවසන් සහතික සඳහා අනුමැතිය ලබා ගැනීම අත පසු විමකින් මඟ හැරී තිබුණි. | මුදල් රෙගුලාසි හා අදාළ ගිවිසුම් විධිවිධාන අනුව අවශ්‍ය අනුමැතීන් ලබාගෙන පමණක් ගෙවීම් සිදු කිරීමටත්, මධ්‍යස්ථානයේ ගොඩනැගිලි හා අනෙකුත් වත්කම් නිසි පරිදි නඩත්තු කර ඒවායේ භාවිතාකාරී තත්ත්වය පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2025 සැප්තැම්බර් 04 දිනැති අංක අමප/25/1531/804/179 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමත කරන ලද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද අරමුදල් සමාලෝචන කමිටුවේ 2025 ජූලි 02 දිනැති වාර්තාවේ 6 වන ඡේදය ප්‍රකාරව, මෙම අරමුදල නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කළ යුතු අරමුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව නීතිපතිවරයාගේ උපදෙස් ලබාගෙන තිබුණද, එම උපදෙස් අනුව අරමුදලේ අනාගත පැවැත්ම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග හා ඊට අදාළ නෛතික කටයුතු මෙම වාර්තාවේ දිනය වන විටත් අවසන් කර නොතිබුණි. | නීතිපතිගෙන් විමසා අදාළ තීරණය ලැබී ඇති අතර මේ පිළිබඳ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. දෙපාර්තමේන්තුවේ මෙම කටයුතු විධිමත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විගණන කළමනාකරණ කමිටුවේ සාකච්ඡා වූ පරිදි පත්කරන ලද විශේෂ කමිටු මඟින් මෙම අරමුදල් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ලැබේ. | 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 වන වගන්තියේ (4) වන උපවගන්තිය ප්‍රකාරව අදාළ කටයුතු සඳහා ලබා දී ඇති කාලසීමාව අවසන් වී ඇති බැවින්, නීතිපතිවරයාගේ උපදෙස් හා අදාළ නීතිමය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් මෙම අරමුදල සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ තනි පුද්ගල සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ජීවනෝපාය සංවර්ධන අංශය විසින් 2025 ජුනි 25 දිනැති අංක 2025/08 දරන | තනි පුද්ගල සවිබල ගැන්වීමේ වැඩසටහන සඳහා 2025 නොවැම්බර් 11 හා 2025 දෙසැම්බර් 09 යන දිනයන්හි | සවිබල ගැන්වීමේ වැඩසටහන් නියමිත කාලසීමාව තුළ ක්‍රියාත්මක වන පරිදි අවශ්‍ය සැලසුම් |

| | | | |
|---|---|---|---|
| | චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති 2,253ක් සඳහා 2025 නොවැම්බර් 11 හා දෙසැම්බර් 09 යන දිනවලදී පිළිවෙළින් රු.129,859,717ක් හා රු.37,614,969ක් ලෙස එකතුව රු.167,474,686ක් දිස්ත්‍රික්ක 20 ක් වෙත නිදහස් කර තිබුණි. ඉන් රු.136,312,386ක් ව්‍යාපෘති 1,909ක් සඳහා වැය කර තිබුණද, චක්‍රලේඛය නිකුත් කිරීම හා අරමුදල් නිදහස් කිරීම වර්ෂයේ අවසන් භාගයේදී සිදුකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි . | ව්‍යාපෘති 2,244 ක් සඳහා පිළිවෙළින් රු.129,859,717 ක් හා රු.37,614,969 දිස්ත්‍රික්ක වෙත ලබා දී ඇත. මෙම වැඩසටහන සඳහා මුදල් ලබා දීම සිදු වූ අවධියේ දිට්වා සුළිකුණාටු තත්ත්වය ඇතැම් දිස්ත්‍රික්කවලට බලපෑ අතර අනෙකුත් දිස්ත්‍රික්ක ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ඉතිරි මුදල් ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ දී තනි පුද්ගල ව්‍යාපෘති 1,909 ක්‍රියාත්මක කල අතර ඒ සඳහා රු.136,312,386 ලබා දී ඇත. | හා පරිපාලන කටයුතු කල්තියා සිදුකර, ප්‍රතිලාභීන් වෙත අදාළ ප්‍රතිලාභ කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහන සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාව අනුව, 2025 ජුනි 25 දිනැති අංක 2025/08 දරන සමෘද්ධි චක්‍රලේඛය ප්‍රකාරව සමාජ ආරක්ෂණ අරමුදල් ලබාගැනීම සඳහා සමෘද්ධි සංවර්ධන භාරකාර මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘති 150කින් ව්‍යාපෘති 107ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව, ප්‍රතිපාදන රු.3,629,641ක් වූ ව්‍යාපෘති 43ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක් විසින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අදාළ ප්‍රතිපාදන ආපසු හරවා එවා තිබුණි. | 2025 වර්ෂයේ මාතර දිස්ත්‍රික්කයේ තනි පුද්ගල ව්‍යාපෘති 205 සඳහා රු.15,039,490 ලබා දී ඇති අතර ඉන් තනි පුද්ගල ව්‍යාපෘති 162 ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා රු.11,452,328 වියදම් කර ඇත. එහි ඉතිරි මුදල් ලෙස රු.3,782,675 තැන්පත් කර ඇත. | අනුමත කරන ලද සවිබල ගැන්වීමේ ව්‍යාපෘති නියමිත කාලසීමාව තුළ ක්‍රියාත්මක වන බවට කාලීන අධීක්ෂණයක් සිදුකර, වෙන් කළ ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කර ප්‍රතිලාභීන් සවිබල ගැන්වීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2024 පෙබරවාරි 14 දිනැති සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2024/04 දරන මූලා චක්‍රලේඛය අනුව, විශාල ඉඩම් ප්‍රමාණයක් සහිත පුහුණු මධ්‍යස්ථානවල එම ඉඩම් උපරිම ආදායම් උත්පාදනයක් සිදු වන පරිදි වගා කටයුතු හෝ වෙනත් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා බදු හෝ කුලී පදනම මත යොදා ගැනීමට කටයුතු කළ යුතු බවට උපදෙස් ලබාදී තිබුණි. එහෙත්, නිලාවෙලි සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය සතු ඉඩම් සම්බන්ධයෙන් එම උපදෙස් | දිගුකාලීන බෝග ලෙස පොල් පැල, තැඹිලි පැල, අඹ පැල, පුවක්, කෙසෙල් පැල හා දෙළුම් වගා කළද මේ වන විට ස්වාභාවික හේතූන් මත හා සතුන්ගෙන් සිදු වූ හානි හේතුවෙන් පොල් , අඹ, පුවක් පැල යම් ප්‍රමාණයක් සක්‍රියව පවතන අතර පොල් සඳහා පොහොර යෙදීම සිදු කර ඇත.<br>තවද තෝරාගත් බිම් කොටසක දෙළුම් වගාව සිදු කිරීම සඳහා | අරමුදල සතු ඉඩම්වල පවත්නා සම්පත් හා විභවතාවයන් ඇගයීමට ලක් කර, ඒවා උපරිම ඵලදායීතාවයෙන් උපයෝජනය කර තිරසාර ආදායම් උත්පාදනයක් සිදුකළ හැකි වැඩපිළිවෙළක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අනුව ආදායම් උත්පාදනය සඳහා ඵලදායී හා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර නොතිබුණි. | භාරකාර මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, 2026 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත. | |
| (ආ) | 2023 ජුලි මාසයේ සිට සමෘද්ධි සහනාධාර වැඩසටහන නතර කිරීම හේතුවෙන් සමෘද්ධි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීමද නතර වී තිබූ බැවින්, රු.1,010,000ක වියදමක් දරා සංවර්ධනය කර තිබූ ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය සමාලෝචිත වර්ෂයේදීද, උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව, එම වත්කම වෙනුවෙන් වැය කරන ලද මුදලට සාපේක්ෂව අපේක්ෂිත ප්‍රතිලාභය අත්කර ගැනීමට නොහැකි වී තිබුණි. | වර්තමානයේ දෙපාර්තමේන්තු වෙත පැවරි ඇති කාර්යභාරය අනුව සවිබලගැන්වීම සඳහා තෝරාගනු ලබන අස්වැසුම ප්‍රතිලාභීන් මෙම දත්ත පද්ධතියට ඇතුලත් කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. දෙපාර්තමේන්තු කාර්යභාරයට අනුගතව සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ කටයුතු මෙහෙයවීම සඳහා අරමුදලේ භාරකාර ඔප්පුව සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. | ප්‍රතිලාභී කළමනාකරණ මොඩියුලය වර්තමාන කාර්යභාරයන්ට ගැළපෙන පරිදි කඩිනමින් ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත්, එය තවදුරටත් භාවිතයට ගත නොහැකි නම් එම වත්කම සම්බන්ධයෙන් විධිමත් තීරණයක් ගෙන ඵලදායී වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේදී සමාජ ආරක්ෂණ භාරකාර මණ්ඩලය විසින් නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානය සඳහා CCTV කැමරා 08ක් මිලදී ගැනීමට රු.270,000ක ප්‍රතිපාදන අනුමත කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එම කැමරා මිලදී ගැනීම සඳහා රු.411,000ක් වැය කර තිබීමෙන් අනුමත ප්‍රතිපාදන ඉක්මවා රු.141,000ක් වැය කර තිබුණි. තවද, මිලදී ගත් කැමරා 08න් කැමරා 03ක් පමණක් රූපවාහිනී තිරය ඔස්සේ නිරීක්ෂණය කළ හැකි පරිදි ස්ථාපිත කර තිබූ අතර, සියලුම කැමරා නිරීක්ෂණය කිරීමේ හැකියාව ලබා ගැනීම සඳහා පසුව තවත් රු.65,000ක වියදමක් දැරීමට සිදුව තිබුණි. ඒ අනුව, ප්‍රසම්පාදනයට පෙර අවශ්‍යතාව නිසි ලෙස හඳුනාගෙන පිරිවිතර සකස් නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදනයේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව කෙරෙහි අවධානය ප්‍රමාණවත් ලෙස යොමු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී දළ ඇස්තමේන්තු වටිනාකම රු.270,000 ක ප්‍රතිපාදන CCTV කැමරා මිල දී ගැනීම සඳහා වෙන් කර තිබුණි. මිල ගණන් කැඳවුවද නිසියාකාරව මිල ගණන් ඉදිරිපත් නොවීම හේතුවෙන් මෙම කටයුතු සමාලෝචිත වර්ෂය වන තෙක් ඉටු කර ගැනීමට නොහැකි වූ අතර 2025 වර්ෂයේ දි සංශෝධිත අයවැය ඇස්තමේන්තු මගින් මෙම ප්‍රතිපාදනය සංශෝධනය කර ඇත. ප්‍රධාන ගොඩනැගිල්ලේ සවි කර ඇති කැමරා පමණක් රූපවාහිනිය ඔස්සේ නැරඹීමේ හැකියාව ඇති අතර, අනෙකුත් ගොඩනැගිලි වලට සම්බන්ධ කැමරා රූපවාහිනි තිරයෙන් නැරඹීමේ හැකියාව ලබා ගැනීම සඳහා රු. 65,000 ක් වැය වන බවට අදාල ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මුදලට භාරකාර මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | ප්‍රසම්පාදනයන් අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන සැලසුම් කල යුතු අතර කාර්යක්ෂමව ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතු අතර අදාල නිලධාරීන්ට එම කාර්යය ඉටු කිරීමට නිසි ලෙස වගකීම පැවරිය යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (i) 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1)(ඇ) ප්‍රකාරව ඉදිරි වර්ෂයේ අයවැය ලේඛණය සකස් කොට පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 ට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර එහි පිටපතක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයට අදාලව අරමුදලේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ප්‍රමාදයක් සිදු වු බව දන්වා සිටින අතර, ඉදිරි වර්ෂයේ දි ප්‍රමාදයන් වලක්වා ගැනිමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව නියමිත කාලසීමාව තුළ අයවැය ඇස්තමේන්තු සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු අතර, ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් ඇති නොවන පරිදි අධීක්ෂණ ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |